# බුදුරජාණන් වහන්සේ පිළිබඳ ථෙරවාද හා මහායාන දර්ශනාගත අදහස් විසුමක්

ඉලුක්කේවෙල ධම්මරතන හිමි

බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව විවිධ අදහස් ජනනය වීම භික්ෂු සංඝයා වහන්සේ අතින් ම සිදු වීම සංවේග දනවන්නකි. කෙසේ වුව ද මෙවන් දෑ සිදුවිය හැකි බව උන්වහන්සේ ද දැන සිටි බව බුද්ධ චරිතයේ බොහෝ සිදුවීම් ඇසුරින් සනාථ කළ හැක. බුදුරජාණන් වහන්සේ නමකට ද තවත් බුදුරජාණන් වහන්සේ නමක් පිළිබඳ ව සවිස්තරාත්මක විවරණයක් සිදු කිරීම අපහසු බව ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් ම දේශනා කරන ලදි. එසේ ම සාකච්ඡා කොට අධ්‍යයනයන් සිදු කොට අවසන් කළ නො හැකි නිවැරදි ව පොදු එකඟතාවයකට පැමිණිය නො හැකි දිගින් දිගට සිතීමෙන් උමතු බවට දුකට පත්කරන ප්‍රස්තුත හතරක් පවතින බව බුදුරජාණන් වහන්සේ විසින් ලෝක සත්ත්වයා විෂයෙහි පෙන්වා දුණි.[1]

1. බුද්ධ විෂය
2. ලෝක විෂය
3. කර්ම විෂය
4. ධ්‍යාන විෂය

බුද්ධ පරිනිර්වාණයෙන් පසු සිදු වූ භික්ෂු සංස්ථාවේ බෙදීයාමත් සමඟ ම බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව විවිධ අදහස් හා මතිමතාන්තර වේගයෙන් ව්‍යාප්ත වීමට පටන් ගැනිණි. මහාසංඝික නිකායික භික්ෂූන්ගේ මූලිකත්වයෙන් ව්‍යාප්ත වූ මහායාන සම්ප්‍රදාය බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යත්වය ඉක්ම වූ දෙවියෙකු කොට සලකන අතර ප්‍රථම ධර්ම සංඝායනාවට සම්බන්ධ වූ පන්සියයක් භික්ෂූන් වහන්සේගෙන් පෝෂණය වූ ථෙරවාදී සම්ප්‍රදාය බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යත්වයෙහිලා සලකයි.

මේ සුවිශේෂී භාවයට මූලික සිද්ධාන්තය වූයේ රහතන් වහන්සේ පිළිබඳ ව ඇති කරගන්නා ලද මතභේදය යි. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් තුන් මසක් ගෙවුනු පසු ව පවත්වන ලද ප්‍රථම ධර්ම සංඝායනාව සඳහා සහභාගී කරගන්නා ලද්දේ අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන යන සිවුපිළිසිඹියා ලාභී මහරහතන් වහන්සේ පමණි. මේ පිළිබඳ ව තරමක පසුතැවීමකින් සිටි භික්ෂූන් වහන්සේ සංගීති කාරක මහරහතන් වහන්සේලාගේ අදහස පිළිගැනීමට පසුබට වූහ. මෙහි ප්‍රතිඵලය වූයේ සංගීති කාරක ථෙරුන් වහන්සේලාගේ මතවාද පිළිගැනීම වෙනුවට තම මත පිළිගැනීම යි. ඒ සඳහා ඔවුන් සංඝායනාවක් කළ බව ද නලිනාක්ෂ දත් මහතා පෙන්වා දෙයි. මථුරා, සංකස්සපුර, කාම්බෝජ, සැවැත් නුවර, සාකේත නුවර සහ මධ්‍යය ප්‍රදේශයෙන් වැඩම වන ලද භික්ෂූන් වහන්සේලා හත්සිය නමකගෙන් සමන්විත වූ සංඝ සම්මේලනයක් විශාලාවෙහි වාලුකා සංඝාරාමයේ දී පැවැත් විය. මේ සඳහා බුදුරජාණන් වහන්සේගෙන් ම ධර්මය ශ්‍රවණය කළ භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කර ගත් අතර පෘතග්ජන භික්ෂූන් වහන්සේලා මෙන් ම සේඛ, අසේඛ, ත්‍රිවිධ්‍යාධර, අභිඥාලාභී, ධ්‍යානලාභී, සහ ගොත්‍රභූ [2] ආදී සෑම ආධ්‍යාත්මික ස්ථරයක් ම නියෝජනය වන පරිදෙන් භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කර ගන්නා ලදි.[3] මෙම සම්මෙලනයෙන් අනතුරු ව බුද්ධ පරිනිර්වාණයෙන් වසර 116කට පසු කාලාශෝක රජතුමාගේ රාජ්‍ය කාලයෙහි ධර්ම සංඝායනාවක් පැළලුප් නුවර දී සිදු කරන ලදි. මෙම ධර්ම සංඝායනාව දෙවන ධර්ම සංඝායනාව නමින් සැලකේ. මෙම සංඝායනාවේ දී මහාදේව

[1] අචින්තයය සූත්‍රය, අ.නි. 2, බුජමු. පිට.150
බුද්ධානං භික්ඛවෙ බුද්ධවිසයො අචින්තෙයයො න චින්තෙතබ්බො, යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස ... ඣායිස්ස භික්ඛවෙ ඣානවිසයො .... කම්මවිපාකො භික්ඛවෙ ... ලොකචින්තා භික්ඛවෙ...
[2] prthagjanas, saiksas, asaiksas, traividtas, and sadbhajñas, balaprāptas and vaisibhutas
[3] Buddhist Sects in India, Nalinaksha Dutt, Delhi, 1998, p. 21

මහරහතන් වහන්සේ එක් පාර්ශවයක් නියෝජනය කළ අතර අනෙක් පාර්ශවය නියෝජනය කරන ලද්දේ ස්ථවිරවාදී තෙරුන් වහන්සේලා විසිනි.[4] මෙම සංඝායනාව සිදුවන කාලය වන විට භික්ෂු ශාසනය ස්ථවිරවාදී සහ මහාසංඝික වශයෙන් දෙකොටසකට බෙදී පැවති අතර සංඝායනාවෙන් පසුව මහාසංඝික පාර්ශවය නියෝජනය කළ භික්ෂූන් වහන්සේ මහායාන සම්ප්‍රදාය සංවර්ධයන කිරීමෙහි නියැලුණු අතර ස්ථවිරවාදී පාර්ශවය නියෝජනය කළ භික්ෂූන් වහන්සේ ථෙරවාදී සම්ප්‍රදාය සංවර්ධයනය කිරීමේ කාර්යයෙහි නියැලුණහ. පසුකාලීනව ථෙරවාදී සම්ප්‍රදාය දකුණු දිග බුදුසමය නමින් ද මහාසංඝික සම්ප්‍රදාය උතුරුදිග බුදුසමය නමින් ද ව්‍යාප්ත විය.

දකුණු දිග බුදුසමයාගත සම්ප්‍රදායයන් බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යත්වයෙහි ලා පිළිගත්ත ද උතුරුදිග බුදුසමයාගත සම්ප්‍රදායයෝ මේ මතයට හාත්පසින් ම විරුද්ධ අදහසක් දක්වති. ප්‍රථම ධර්ම සංඝායනාව සඳහා සම්බන්ධ වූයේ සිවුවනක් පිරිසෙන් ඉතා ම සුළු පිරිසක් හෙයින් එය මහා සංඝයාගේ තීරණය යැයි පිළිගත නො හැකි බව මොවුහු තව දුරටත් පෙන්වා දෙති. භික්ඛු, භික්ඛුණී, උපාසක සහ උපාසිකා යන සිවුවනක් පිරිස ම ප්‍රථම සංඝායනාව නියෝජනය කළ යුතුව පැවතිය ද ඒ සඳහා සහභාගී කරවා ගන්නා ලද්දේ සිවුවනක් පිරිසෙන් එක් කොටසක් පමණක් වන අතර එයිනුදු තෝරා ගත්තේ සිවුපිළිසිඹියාපත් මහරහතන් වහන්සේ පන්සිය නමක් පමණි. බුදුරාජණන් වහන්සේ ධරමාන කාලයේ දී ද ශාසනයේ චිර පැවැත්මට බාධා කරවන බොහෝ දෑ සිදු විය.  එවන් අවස්ථාවන් වලදී ද උන්වහන්සේ විසින් සිවුවනක් පිරිසෙහි ම සහයෝගය අපේක්ෂා කරන ලදි. ඒ අනුව විවිධාකාරයෙන් සම්බුද්ධ ශාසනයට පැමිණි අර්බුදකාරී තත්වයන් පාලනය කිරීමේ දී ත් නව විනය නීති පැනවීමේ දී ත් එමෙන් ම පැනවූ නීතී යළි ලිහිල් කිරීමේ දී ත් නිරන්තරයෙන් ම සියලු දෙනාගෙන් ම අදහස් සලකා බැලූ බව මෙහි දී පෙන්වා දීමට පිළිවන. මෙනයින් බලන කල මහායානිකයන්ගේ බෙදීයාම සාධාරණ වූ වක් බව හැඟී යයි. කෙසේ වෙතත් ශාසනික උන්නතිය වෙනුවෙන් ගත හැකි වටිනා ම තීරණය වන්නේ බෙදීයාමකින් තොර ව එය ආරක්ෂා කර ගැනීම වුවත්  මෙම සම්ප්‍රදාය දෙකට ම ශාසනයේ නො බෙදීයාම ආරක්ෂා කර ගැණීමට නො හැකි වූ බව කණගාටුවෙන් වුව ද සඳහන් කළ යුතුය.

බුදුදහමේ ප්‍රථම බෙදීම සිදු වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් සිය වසකට පමණ පසු ව බව වසුමිත්‍රගේ අදහස යි.[5] මේ සඳහා ඉවහල් වූ හේතුවක් ලෙස ඔහු පෙන්වා දෙන්නේ අර්හත්වය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කොට ඒ වෙනුවට බුද්ධත්වය ආරෝපණය කිරීම යි. සදාකාලික සුඛය හෙවත් නිර්වාණය අවබෝධ කිරීමට නම් හැම කෙනෙකු ම බුද්ධත්වයට පත් විය යුතු බව සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයෙහි සඳහන් වේ. ථෙරවාදයෙහි ඉගැන්වෙන අර්හත්වය හෙවත් නිවන දුඃඛස්කන්ධයෙන් මිදීමක් පමණි. එනිසා අරහත් තත්වලාභියා බෝධිසත්ත්ව බවට පත් වී අවසාන වශයෙන් බුද්ධත්වයට පත් විය යුතුය.

ස්ථවිරයන් වහන්සේලාගේ දුර්වලකම් පෙන්නුම් කරමින් රහත් භාවය හෑල්ලුවට ලක් කිරීම මහාසංඝිකයන්ගේ අභිප්‍රාය විය. ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් නිවැරදි තීරණ ගැනීමට තරම් බුද්ධිමත් නො වූ පිරිසක් බව පවසමින් රහතන් වහන්සේගේ රහත් බව හෑල්ලුවට ලක් කිරීමට මොවුහු නිරන්තරයෙන් ක්‍රියා කළහ. මේ මතභේදාත්මක අදහස් උදහස් සමඟ ම බුදුරජාණන් වහන්සේගේ අගය හා වටිනාකම තවදුරටත් ඔප්නැංවෙන්නට විය. බුදුරජාණන් වහන්සේ වැඩසිටියා නම් මෙවැන්නක් සම්බුද්ධ ශාසනය විෂයෙහි සිදු නො

[4] Buddhist Sects in India, Nalinaksha Dutt, Delhi, 1998, p. 23
[5] Bhinna Nikata Dharmackr asastra - T aistro 49, p.15-16

වන බව මහාසංඝික සම්ප්‍රදාය නියෝජනය කළ හැමදෙනාගේ ම මතය විය. එහි ප්‍රතිඵලය වූයේ ද රහත් භාවයට පත්වීම හැල්ලුවට ලක්වීම බුද්ධත්වයට පත්වීම ඉතා උසස් කොට සැලකීමට පටන් ගැනීම යි.

බුදුරජාණන් වහන්සේ පිළිබඳ අතිමානුෂිකත්වය වනාහි පාලි ත්‍රිපිටකය තුළින් ආරම්භ වී ථෙරවාද අට්ඨකථා මගින් පෝෂණය වී පසුව මහා වස්තුවෙන් පරිපූර්ණත්වයට පත් ව ක්‍රමයෙන් ලලිත විස්තරය හා දිව්‍යවදාන වැනි කෘතීන්ට ද සංක්‍රමණය වූ වක් බව බෙල්ලන්විල විමලරතන හිමියෝ පෙන්වා දෙති.[6] ථෙරවාදයෙන් මහාසංඝිකයන් වෙන් වූ අතර, බුදුරජාණන් වහන්සේ ලෝකෝත්තර වාදයෙන් සැලකූ ලෝකුත්තරවාද නිකාය ද මහාසාංඝිකවාදයේ ම අනුශාඛාවක් විය. ඒ අනුව බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් දෙකකට පමණ පසුව (ක්‍රි. පූ. 3 වැනි සියවස) ලෝකෝත්තරවාදී සම්ප්‍රදාය[7] ආරම්භ වූ බව බෙල්ලන්විල විමලරතන හිමියන් තව දුරටත් පෙන්වා දෙයි.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ඨාංගික මාර්ගය සහ පටිච්චසමුප්පාදය යන මූලික ධර්ම කරුණුවලින් යුක්ත ය.[8] ථෙරවාදය හා මහායානය පිළිබඳව සළකා බැලීමේ දී පෙනී යන්නේ ථෙරවාදයේ මූලික ඉගැන්වීම ලෙස චතුරාර්ය සත්‍යය පිළිගන්නා අතර මහායානික සම්ප්‍රදායෙන් ගොඩනැගුණු මාධ්‍යමික සම්ප්‍රදාය අදහස් කරන්නේ එය පටිච්චසමුප්පාදය බවයි. එබැවින් මහායානිකයන්ගේ අදහස වී ඇත්තේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ප්‍රථම සූත්‍ර දේශනය වන චතුරාර්ය සත්‍ය දේශනය ශ්‍රවණය කිරීමෙන් අනතුරුව ඔවුන් ශ්‍රාවකයන් බවට පත් වූ බව යි. මහායාන සම්ප්‍රදායට අනුව ශ්‍රාවකයන් යනු සූත්‍රාගත කරුණු පමණක් අවබෝධ කරගෙන අර්හත් බව ලබාගන්නා අය යි. විශේෂයෙන් ම මොවුහු පුද්ගල නෛර්යාත්මය අවබෝධ කරගන්නා නමුත් ධර්ම නෛර්යාත්මය (ධර්ම ශූන්‍යතාව) අවබෝධ කර නො ගනී හෙවත් තථතාව නො වටහා ගනී.[9] සරල ව දක්වතොත් පුද්ගල නෛර්යාත්මය යනු පඤ්චස්කන්ධාදී වශයෙන් කෙරෙන බෙදීම් ඔස්සේ ප්‍රතික්ෂේප වන සත්ත්ව පුද්ගල පැවැත්ම අවබෝධ කර ගැනීම යි. ධර්ම නෛර්යාත්මය යනු මෙම බෙදීම් ඔස්සේ ඉතිරි වන ස්කන්ධාදියෙහි පැවැත්ම ප්‍රතික්ෂේප වන බව අවබෝධ කර ගැනීම යි. මේ අනුව, පුද්ගල නෛර්යාත්මය අවබෝධ කර ගැනීමෙන් රහත්භාවයත් ධර්ම නෛර්යාත්මය අවබෝධ කර ගැනීමෙන් බුද්ධත්වයත් ලබාගත හැකි බව මහායාන සම්ප්‍රදායෙහි අදහස යි.

බුදුරජාණන් වහන්සේ පිළිබඳව ලෝකෝත්තර මත වාද ඇති වීමට මූලික වශයෙන් හේතු වී ඇත්තේ අරිය පරියේසන සූත්‍රාගත කරුණු ය. ඒ නිසා ඒ පිළිබඳ ව මෙහිදී විමසා බැලිය යුතුය. විශේෂයෙන් ම බුද්ධත්වය අවබෝධ කර ගැනීමත් සමග ම උන්වහන්සේ ක්‍රියා කළ අන්දම විවිධ අදහස් ප්‍රභවය වීමට ඉවහල් වී ඇත.

''තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය ඉතා ගැඹුරු ය. දැක්මට අවබෝධයට නො පහසු ය. ශාන්තය, ප්‍රණීතය. තර්කයෙන් බැසගත නො හෙන්නේ ය. නිපුණ ය. පණ්ඩිතයන් විසින් දත යුතු ය. මේ ප්‍රජාතොමෝ පඤ්චකාමගුණ සංඛ්‍යාත ආලයන්හි රමණය කරන්නී ය. ආලයන්හි ඇලුණී ය. පඤ්චකාමගුණයෙහි සතුටු වන්නී ය. පඤ්චකාම ආලයන්හි රමණය කරණ ආලයන්හි ඇලුණු ආලයන්හි සතුටු ප්‍රජාව විසින්, යම් මේ ඉදප්පච්චයා (සංස්කාරාදීන්ට ප්‍රත්‍යය වූ අවිද්‍යා දී) පටිච්චසමුපපාදයක් වේ ද, මේ කාරණය දක්නට නො පහසු ය. සියලු සංස්කාරයන්ගේ සංහිදීම වූ සියලු උපධීන්ගේ දුර ලීම වූ ආශාව නැති

[6] බෞද්ධ මහා පුරුෂ සංකල්පය, බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2000, පිට.45
[7] බෞද්ධ මහා පුරුෂ සංකල්පය, බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2000, පිට.46
[8] Buddhist Sects in India, Nalinaksha Dutt, Motilal Bamarsidass, Delhi, 1998, p. 71
[9] Buddhist Sects in India, Nalinaksha Dutt, Motilal Bamarsidass, Delhi, 1998, p. 71-2

කිරීම වූ විරාගය වූ නිරෝධය වූ යම් මේ නිවනක් වේ ද, මේ කාරණය ද දැක්මට නො හැකි ය. මම දහම් දෙසන්නෙම් නම් අන්‍යයෝ එය දැන නො ගන්නාහු නම්, එය මට ක්ලාන්තයකි. එය මට වෙහෙසකි. තව ද මට නො ඇසූ විරූ අත්‍යාශ්චර්ය වූ මේ ගාථාවෝ වැටහුණාහ:'' [10]

මේ අනුව පෙනී යන්නේ බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය ඉතා ගැඹුරු වූ වක් වන හෙයින් එය සාමාන්‍ය ජනයාට අවබෝධ කරගැනීමට නො හැකි බව යි. එය දේශනා කරන්නට යාමෙන් සිදුවන්නේ තමන් වහන්සේ වෙහෙසට පත්වීම පමණක් ම යැයි උන් වහන්සේගේ සිතෙහි වූ බව යි.

''මා විසින් දුක සේ අවබෝධ කරණ ලද මේ ධර්මය දැන් ප්‍රකාශ කිරීම කම් නැත. රාග ද්වේෂයන්ගෙන් මැඩුනවුන් විසින් මේ ධර්මය අවබෝධ කිරීම පහසු නො වේ. උඩුහොය කරා යන සුලු මෘදු වූ ගැඹුරු වූ අවබෝධයට අපහසු වූ සියුම් වූ මේ ධර්මය රාගයෙන් රත් වූ මොහරාශියෙන් වෙළුණු මේ සත්ත්වයෝ නො දක්නාහ.'' [11]

බුදුරජාණන් වහන්සේ ලොව මෙහෙනි කර බලන විට උන්වහන්සේ දුටුවේ තමන් වහන්සේ විසින් අවබෝධ කර ගත් මේ ශ්‍රී සද්ධර්මය අවබෝධ කර ගත හැකි අයෙකු නොවන බව යි. කෙසේ වුව ද බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කර ගත් ධර්මය වටහා ගත හැකි අර්හත් තත්වයට පත් විය හැකි මිනිසුන් මෙලොව සිටින හෙයින් ඔවුන් විෂයෙහි ධර්මය දේශනා කරන ලෙස සහම්පතී මහා බ්‍රහ්මයා විසින් බුදුරජාණන් වහන්සේට ආරාධනා කරන ලදි.

''වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්වා. මඳකෙලෙස්රජස් සහිත ස්වභාව ඇති සත්ත්වයෝ ඇත. ධර්මය නො ඇසීමෙන් ඔහු පිරිහෙත්. ධර්මය අවබෝධ කරන්නෝ ඇත.''[12]

''යහපත් ප්‍රඥා ඇති සර්වඥයන් වහන්ස, ශෛලමය පර්වතයක් මුදුනෙහි සිටියෙක් හාත්පස ජන සමූහයා යම්සේ දකී ද, එබඳු උපමා ඇති ධර්මප්‍රාසාදයට නැග තමන් වහන්සේ පහ වූ ශෝක ඇති සේක් ශෝකයෙන් මැඩුණු සත්ත්ව සමූහයා බලන සේක්වා. මාරසංග්‍රාමය දිනූ වීරයන් වහන්ස, සාර්ථවාහකයන් වහන්ස, කාමච්ඡන්ද සංඛ්‍යාත ණය නැතියාණන් වහන්ස, නැගීසිටිනු මැනව. ලෝකයෙහි හැසිරෙනු මැනව භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරණ සේක්වා. අවබෝධ කරන්නෝ ඇති වන්නාහ.''[13]

---

[10] අරිය පරියෙසන සූත්‍රය, ම.නි. 1, බුජමු. පිට 408
අධිගතො ඛො මයායං ධමෙමා ගමභීරො දුදදසො දුරනුබොධො සනෙතා පණීතො අතකකාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො. ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසම්මුදිතා. ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසම්මුදිතාය දුදදසං ඉදං ඨානං යදිදං ඉදපපචචයතාපටිචචසමුපපාදො, ඉදම්පි ඛො ඨානං දුදදසං යදිදං සබබසඞඛාරසමථො සබබූපධිපටිනිසසගෙගා තණහකඛයො විරාගො නිරොධො නිබබානං. අහඤෙචව ඛො පන ධමමං දෙසෙයයං පරෙ ච මෙ න ආජානෙයයුං, සො මමසස කිලමථො, සා මමසස විහෙසාති. අපිසසු මං භිකඛවෙ ඉමා අනචඡරියා ගාථා පටිභංසු පුබෙබ අසසුතපුබබාඃ

[11] අරිය පරියෙසන සූත්‍රය, ම.නි. 1, බුජමු. පිට 408
කිචෙඡන මෙ අධිගතං හලන්දානි පකාසිතුං - රාගදොසපරෙතෙහි නායං ධමෙමා සුසමබුධො.
පටිසොතගාමිං නිපුණං ගමභීරං දුදදසං අණුං - රාගරතතා න දකඛිනති තමොකඛනෙධන ආවටාති.
[12] අරිය පරියෙසන සූත්‍රය, ම.නි. 1, බුජමු. පිට 410
දෙසෙතු භනෙත භගවා ධමමං. දෙසෙතු සුගතො ධමමං. සනති සතතා අපපරජකඛා ජාතිකා, අසසවණතා ධමමසස පරිහායනති. භවිසසනති ධමමසස අඤඤාතාරො

[13] අරිය පරියෙසන සූත්‍රය, ම.නි. 1, බුජමු. පිට 410
සෙලෙ යථා පබබතමුදධනිටඨිතො, - යථාපි පසෙස ජනතං සමනතතො
තථූපමං ධමමමයං සුමෙධ, - පාසාදමාරුයහ සමනතචකඛු.

මුල දී ධර්මය දේශනා කිරීමට පසුබට වූ බුදුරජාණන් වහන්සේ මහා බ්‍රහ්මයාගේ ආරාධනයෙන් පසු ධර්මය දේශනා කිරීමට තීරණය කිරීම මත හේදයට තුඩු දෙන කරුණකි. මේ සඳහා ඉවහල් කර ගත හැකි කරුණු තුනකි.

1. කිසිවකු විසින් ආරාධනා කරන තුරු ධර්මය නො දෙසීම බුද්ධ ගුණයක් වීම.
2. උන්වහන්සේ විසින් අවබෝධ කර ගත් බුද්ධත්වය අවබෝධකරගත හැකි අයෙකු ලොව විද්‍යමාන නො වීම.
3. ධර්මාවබෝධයට පත්වන පිරිසක් මොලොව සිටින බව නො දැකීම.

ප්‍රථම කරුණ ඇගයීමකට ලක් කළ නො හැකිය. විශේෂයන් ම බුදුරජාණන් වහන්සේ විසින් යමක් සිදු කළ යුතුව ඇත්නම් උන්වහන්සේ එය සිදු කරති. උදාහරණ වශයෙන් යසකුල පුතු පැවිදි කිරීම, නන්ද කුමරු පැවිදි කිරීම, රාහුල කුමරු පැවිදි කිරීම ආදී සියල්ල සිදු කළේ අනාරාධිතව ය. දෙවෙනි කරුණ සලකා බැලීමෙන් පැහැදිලි වන්නේ බුද්ධත්වය තවත් අයෙකුට අවබෝධ කරවිය හැක්කක් නො වන හෙයින් උන්වහන්සේ ඒ සඳහා මැලි වූ බව යි. මහා බ්‍රහ්මයා ආරාධනා කරන්නේ බුද්ධත්වය සඳහා ධර්මය දේශනා කිරීමට නොව ධර්මාවබෝධය සඳහා ධර්මය දේශනා කිරීමට ය. බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයකු වශයෙන් සලකා තෙවෙනි කරුණ සාධාරණී කරණය කල හැකි ය. ඒ අනුව ධර්මය යම් පමණකට හෝ අවබෝධ කර ගැනීමට හැකි පිරිසක් සිටිත් ද යි බුදුරජාණන් වහන්සේ විසින් විමසා බලා නැති බව මේ අනුව පැහැදිලි ය. මෙවැනි සිදු වීම් විනය නීතී පැනවීමේ දී ද සිදු වී ඇත. මුලින් පැන වූ විනය නීති නැවත වෙනස් කිරීම ලිහිල් කිරීම බුදුරජාණන් වහන්සේ විසින් සිදු කරන ලද හෙයින් මේ තෙවන කරුණ ගුණාත්මක ය. එමනිසා මහා බ්‍රහ්මයගේ ආරධනයෙන් අනතුරුව කරුණු සලකා බලා ධර්මය දේශනා කිරීමට උන්වහන්සේට සිත් විය. කෙසේ වුවද බුදුරජාණන් වහන්සේ පිළිබඳ ලෝකෝත්තරවාදී අදහස් ඇති වීමට මෙය හේතුවක් වූයේ සාමාන්‍ය ජනයා විසින් අවබෝධ කර ගත නො හැකි උතුම් තත්‍වයක් උන්වහන්සේ විසින් අවබෝධ කරගත් හෙයිනි.

බුදුරජාණන් වහන්සේ පිළිබඳව ථෙරවාදී හෙවත් ස්ථවිරවාදී ආකල්පය වූයේ උන්වහන්සේ සාමාන්‍ය මනුශ්‍යයෙක් බවත් බුද්ධගයාවේ දී බුද්ධත්වය අබබෝධ කර ගැනීමත් සමග ම උන්වහන්සේ සර්වඥ වූ බවත් ය. බුද්ධත්වය ලබා ගැනීමෙන් අනතුරුව වුව ද කිසිදු ශාරීරික වෙනසක් සිදු වී නොමැති බව ප්‍රථම ධර්ම දේශනය සඳහා බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතනාරාමයට වැඩම වන බව දැක පස්වග තවුසන් විසින් සිදු කරන ලද ප්‍රකාශයෙන් තහවුරු වේ.

''ඇවැත්නි, ප්‍රත්‍යය බහුල කොට ඇති බවට පැමිණ ප්‍රධන් වීර්යයෙන් පිරිහුණු, ප්‍රත්‍යය බහුල කොට ඇති බවට පෙරළුණු මේ ශ්‍රමණ ගෞතම තෙමේ එයි. නො ම වැඳිය යුතු ය. පෙර ගමන් නො කළ යුතු ය. ඔහුගේ පා සිවුරු නො පිළිගත යුතු ය. වැලි, ඉදින් කැමැත්තේ නම් හිඳින්නේ යයි ආසනයක් තැබිය යුතු'' ය කියා යි. [14]

කෙසේ වුව ද මහාසංඝිකයන්ගේ මතය වන්නේ සමස්ථ දිව්‍ය සත්ත්වයන්ට වඩා පුණ්‍ය ශක්තියෙන් සහ දැනුමෙන් පරිපූර්ණ ව පෙර අත්බැව්හි සිටි බෝධිසත්ත්වයන් වහන්සේ මීළඟ අත්බැව්හි සාමාන්‍ය මිනිසෙක් වන්නේ කෙසේ ද යන්නයි. මෙහි දී සිදු ව ඇත්තේ ලෝකව්‍යවහාරයට අනුගත වීමක් වශයෙන්

---

[14] අරියපරියේසන සූත්‍රය, ම.නි. 1. බුජමු. පිට. 416
''අයං බො ආවුසො සමණො ගොතමො ආගච්ඡති බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය. සො නෙව අභිවාදෙතබ්බො, න පච්චුට්ඨාතබ්බො. නාස්ස පත්තචීවරං පටිග්ගහෙතබ්බං. අපි ච ඛො ආසනං ඨපෙතබ්බං සචෙ ආකඞ්ඛිස්සති නිසීදිස්සතී ති.

(ලෝකානුවර්ථන) උන්වහන්සේ සාමාන්‍ය මිනිසෙකු මෙන් කටයුතු කිරීම බව මහාසංඝිකයන්ගේ අදහස යි.[15] බුද්ධත්වය ලබාගැනීම සඳහා බෝධි සත්ත්වවරයෙකු විසින් පූරණය කළ යුතු සියලු පාරමිතා පෙර අත්බැව් වන විට පූරණය කරන ලදි.[16] මේ අනුව බුදුරජාණන් වහන්සේ ලෝකෝත්තර වන්නේ මහාමායාවගේ මව් කුස පිළිසිඳ ගත් දා සිට ය. මහාසාංඝිකයන් සහ ඔවුන්ගේ අනෙකුත් අනුශාඛා ද බුදුරජාණන් වහන්සේ පිළිබඳ මෙවැනි ම වූ ලෝකෝත්තර ලක්‍ෂණ හඳුන්වා දෙති.

බුදුරජාණන් වහන්සේට රූපකාය හා ධර්මකාය වශයෙන් ශරීර ද්වයක් විද්‍යමාන වන බව මහායානයට අයත් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පෙන්වා දුන්න ද දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ හා අසූ අනු ලක්‍ෂණයන් අයත් වන්නේ රූපකායට ද එසේ නැතහොත් ධර්ම කායට ද යන්න එහි පැහැදිලිව දක්වා නැත.[17] බුද්ධ කාය සංකල්පයේ තදනන්තර වර්ධනය පිළිබඳ අවස්ථාව වූයේ ත්‍රිකාය සිද්ධාන්තය යි. පංචවිංශති සාහශ්‍රිකා, දශ සාහස්‍රිකා ප්‍රඥා පාරමිතා සහ අභිසමයාලංකාර, සුවර්ණ ප්‍රභාස, ගණ්ඩව්‍යුහ වැනි මහායානික සූත්‍ර මේ බව තහවුරු කරයි.

''බුදුරජාණන් වහන්සේගේ ශරීරය ලෝකෝත්තර ය.[18] අෂ්ඨාරසධාතුහු කෙලෙස් ධර්මයන් ගෙන් විනිර්මුක්ත වුවාහු ය. කායික, මානසික හා වාචසික ක්‍රියා ආශ්‍රවධර්මයන්ගෙන් අනුපලක්ෂිත (ආශ්‍රව-විසම්ප්‍රයුක්ත) ය. බුද්ධ ශරීරයෙහි ලෞකික වූ කිසිත් නැත. එහි ඇත්තේ නිර්මල බව (අනාශ්‍රව-මාත්‍ර) පමණකි. එය කිසිවකුටත් විනාශ කළ නො හැකි ය.[19] පූර්ව පුණ්‍ය ශක්තියේ ප්‍රතිඵලයක් වන උන්වහන්සේගේ රූපකාය හෙවත් නිර්මාණ කාය අසීමාන්තික ය,[20] (ගැනිය නො හැකි තරම් වූ රූපකාය සංඛ්‍යාවක් අති බව), උන්වහන්සේගේ මෙම නිර්මාණ කායෙන් ලොව ඕනෑ ම ස්ථානයකින් පෙනී සිටිය හැකි ය.'' [21] ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ පිළිබඳ ලෝකෝත්තරවාදී අදහස් මහායානිකයෝ ව්‍යාප්ත කරති.

කෙසේ වුව ද උක්ත අදහස් හා බොහෝ සෙයින් සමාන අදහස් මුල් බුදුසමයාගත සූත්‍රයන්හි ද අටුවා ග්‍රන්ථයන් හි ද දක්නට ලැබෙයි. විශේෂයෙන් ම බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද අත්ථසාලිනී අටුවාවෙහි බුදුරජාණන් වහන්සේ නිර්මාණ කායකින් වැඩ සිටි බව සඳහන් වෙයි. මේ මිනිස් ලොවින් ඉවත් ව තුසිත දෙව්ලොව තුන් මසක් වැඩ වෙසෙමින් සිය මවු දෙව් පුතුනට අභිධර්මය දේශනා කළ බවත් එම දේශනය අතරතුර දී තමන් වහන්සේට හාත්පසින් ම සමාන වන සේ නිර්මිත බුද්ධ රූපයක් මැවූ බවත් ඉන් අනතුරු ව මේ මිනිස් ලොවට වැඩම කළ බවත් එහි සඳහන් වේ.[22]

බුද්ධත්වය ලබාගැනීමෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන් උදෙසා ධර්මය දේශනා කිරීමේ අරමුණින් යුතුව උරුවෙල් දනව්වේ සිට බරණැස ඉසිපතනාරාමයට වැඩමවන අතර මඟ දී උපක නම් ආජීවකයෙකු හමු විය. උපක බුදුරජාණන් වහන්සේ දැක මෙසේ විචාළේය.

''ඇවැත්නි, මුඹවහන්සේගේ චක්ෂුරාදි ඉන්‍ද්‍රියෝ විශේෂයෙන් ප්‍රසන්නය හ. ඡවිවර්ණය පිරිසිදුය ප්‍රභාස්වර ය. ඇවැත්නි නුඹ වහන්සේ කවරකු උදෙසා පැවිදි වූ සේක් ද? මුඹවහන්සේගේ ශාස්තෘවරයා හෝ කවරේ ද?

---

15 Kathāv atthu, xviii, p.4
බුද්ධස්ස භගවතො උච්චාරපස්සාවො අතිවිය අඤ්ඤෙ ගන්ධජාතෙ අධිගණ්හාතී ති
16 Buddhist Sects in India, Nalinaksha Dutt, Motilal Bamarsidass, Delhi, 1998, p. 72
17 බෞද්ධ මහා පුරුෂ සංකල්පය, බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2000, පිට.55
18 මහාවස්තු, ii. පිට. 3
19 Buddhist Sects in India, Nalinaksha Dutt, Motilal Bamarsidass, Delhi, 1998, p. 72
20 Buddhist Sects in India, Nalinaksha Dutt, Motilal Bamarsidass, Delhi, 1998, p. 72
21 Buddhist Sects in India, Nalinaksha Dutt, Motilal Bamarsidass, Delhi, 1998, p. 98
22 බෞද්ධ මහා පුරුෂ සංකල්පය, බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2000, පිට. 56

මුඹවහන්සේ කාගේ ධර්මයකට රුචි කරන සේක් ද?''[23] මෙනයින් පෙනී යන්නේ උන්වහන්සේගේ ශාරීරික ලක්‍ෂණ විමතිය ඇතිකරන සුලු බවයි.

උපක ආජීවකයන් විසින් අසන ලද පැනයට පිළිතුරු සපයන බුදුරජාණන් වහන්සේ: ''මම සියල්ල අභිබවා සිටියෙමි. දත යුතු සියල්ල දන්නෙම් වෙමි. සියලු ධර්මයන්හි නො ඇලුණෙමි. සියලු කෙලෙස් හැර සිටියෙමි. තෘෂ්ණාක්‍ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි අරමුණු කිරීමෙන් කෙලෙසුන්ගෙන් මිදුණෙමි.''[24] යැයි පවසූ බව ථෙරවාදයට අයත් අරියපරියේසන සූත්‍රයේ සඳහන් වේ.

''උන්වහන්සේට සම කල හැකි කිසිවෙකුත් මේ මිනිස් ලොව තුළ විද්‍යාමාන නො වේ.''[25] යනුවෙන් මහායානයට අයත් මහාවස්තුවෙහි සඳහන් වන කරුණට බොහෝ සෙයින් සමාන අදහසක් අරියපරියේසන සූත්‍රයෙහි ම දක්කනට ලැබෙයි. ඒ බව ''මට මේ ලෝකයෙහි ගුරුවරයෙක් නැත. මට සමානයෙක් නැත. දෙවියන් සහිත ලෝකයෙහි මා හට සම පුද්ගලයෙක් නැත.''[26] යනුවෙන් බුදුරජාණන් වහන්සේ විසින් උපක ආජීවකයාට කරන ලද ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි.

බුදුරජාණන් වහන්සේගේ ආයු ප්‍රමාණය පිළිබඳව මහාවස්තුවේ සඳහන් වන්නේ ''... උන්වහන්සේගේ ශක්තීන් අපමණ වේ, ආයු ප්‍රමාණය ද අපමණ වේ'' [27] යනුවෙනි. මේ බව ථෙරවාදයට අයත් මහා පරිනිබ්බාණ සූත්‍රයේ දක්නට ලැබෙයි.
''අනඳයෙනි, තථාගතයන් විසින් සතර ඉදුපාහු භාවිතය හ, බහුලීකෘතය හ, යානීකෘතය හ, වාස්තුකෘතය හ, අනුෂ්ඨිතය හ, පරිචිතය හ, සුසමාරබ්ධය හ, අනඳයෙනි ඒ තථාගතයෝ කැමැති වන්නාහු නම්, කල්පයක් හෝ කල්පාවශේෂයක් හෝ සිටුනාහ'' යි යනුවෙන් ඒ බව බුදුරජාණන් වහන්සේ විසින් අනඳ තෙරුනට වදාළ සේක.[28]

බුදුරජාණන් වහන්සේගේ කායික ක්‍රියා පැහැදිලි කරන ථෙරවාදී සම්ප්‍රදායට අයත් බ්‍රහ්මායු සූත්‍රය මෙසේ විස්තර දක්වයි.
''ගමන් කිරීමේ දී උන්වහන්සේ හැමවිට ම දකුණු පය පෙරට තබයි. එසේ ම පියවරක් ඉතා දීර්ඝ හෝ කෙටි ද නො වේ. එවිට අධෝකාය පමණක් චලනය වෙයි.[29] පසුපස හැරී බලනුයේ ඇතකු මෙන් දක්ෂිණා

---

[23] අරියපරියේසන සූත්‍රය, ම.නි. 1. බුජමු. පිට. 414
විප්පසනනානි බො තෙ ආවුසො ඉන්‍ද්‍රියානි, පරිසුදෙධා ජවිවණෙණා පරියොදාතො. කංසි ත්‍වං ආවුසො උදදිසස පබබජිතො? කො වා තෙ සත්‍ථා? කසස වා ත්‍වං ධමමං රොචෙසීති? කො වා තෙ සත්‍ථා? කසස වා ත්‍වං ධමමං රොචෙසීති?

[24] අරියපරියේසන සූත්‍රය, ම.නි. 1. බුජමු. පිට. 414
සබබාභිභූ සබබවිදූහමසමි
සබෙබසු ධමෙමසු අනූපලිතෙතා,
සබබඤ්ජහො තණහකඛයෙ විමුතෙතා
සයං අභිඤ්ඤාය කමුදදිසෙයාං?
[25] Mahāvastu, i, p. 159
[26] අරියපරියේසන සූත්‍රය, ම.නි. 1. බුජමු. පිට. 414
න මෙ ආචරියො අත්‍ථි සදිසො මෙ න විජජති,
සදෙවකසමිං ලොකසමිං නත්‍ථි මෙ පටිපුගගලො.

[27] Buddhist Sects in India, Nalinaksha Dutt, Motilal Bamarsidass, Delhi, 1998, p. 98
[28] මහාපරිනිබබාණ සූත්‍රය, දී.නී. 2, බුජමු. පිට. 162
තථාගතසස බො ආනන්‍ද චතතාරො ඉදධිපාදා භාවිතා බහුලීකතා යානිකතා වත්‍ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරදධා. සො ආකඞකමානො ආනන්‍ද තථාගතො කප්පං වා තිට්ඨෙයා කප්පාවසෙසංවා' ති.
[29] බ්‍රහ්මායු සූත්‍රය, ම.නි. 2, බුජමු. පිට. 282
ගචඡනෙතා බො පන සො භවං ගොතමො දක්ඛිණෙනෙව පාදෙන පඨමං පකකමති, සො නාතිදූරෙ පාදං උදධරති, නාචචාසනෙන පාදං නික්ඛිපති, සො නාතිසීඝං ගචඡති, නිතිසනිකං ගචඡති, න ච අදදුවෙන අදදුවං සඞඝට්ටෙනෙතා ගචඡති, න ච ගොප්ඵකෙන

වෘත්තාකාරයෙනි. නිවසකට ඇතුල් වීමේ දී කිසිවිටෙක කඳ නො නැමේ.[30] පාත්‍රය සේදීම සඳහා පැන් පිළිගැනීමේ දී ආහාර වළඳන විට,[31] වළඳ අන්තයෙහි අත සෝදන විට හෝ භුක්තානුමෝදනය කරන විට අතිශය ආකල්ප සම්පන්නව උත්තම චරණානුකූලව අකුටිලව වැඩ හිඳිති.''[32]

එසේ ම ථෙරවාදී සම්ප්‍රදායට ම අයත් සෝණදණ්ඩ සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේගේ රූපසම්පත්තිය පිළිබඳ විස්තරයක් එයි.
''මහණ ගොයුම්හු වූ කලි විශිෂ්ට රූප සම්පත් ඇත්තෝ ය, දැකුම් කටයුතු හ, ප්‍රසාදජනක හ, උතුම් වර්ණ සෞන්දර්යයෙන් සමන්විත හ, බඹහු සේ උතුම් රන් පැහැ ඇත්තෝ ය, උත්තම ශරීර ප්‍රභා ඇත්තෝ ය, සිය සිරුරෙහි දැක්මට නො මඳ වූ අවකාශ ඇත්තෝ ය...'' [33]

ථෙරවාදී සම්ප්‍රදායට අයත් පුප්ඵ සූත්‍රයේ දී ද උන්වහන්සේ පිළිබඳ තවත් විස්තරයක් හමු වේ.
''මහණෙනි, දියෙහි හටගත් දියෙහි වැඩුණු උපුලෙක් හෝ පියුමෙක් හෝ හෙළපියුමෙක් හෝ දියෙන් නැගී දියෙන් නො ගැටී යම්සේ සිටුනේ ද මහණෙනි, එසෙයින් ම තථාගත තෙමේ ලොවැ උපන්නේ ලොවැ වැඩුණේ ලොව මැඩගෙන ලෝකයා හා නො ගැටී වාසය කෙරේ යි.''[34]

බුදුරජාණන් වහන්සේගේ අතිමානුෂිකත්වය ප්‍රකට කරන සුවිශේෂී අංග ලක්ෂණයකි දෙතිස් මහා පුරුෂ ලක්ෂණ. මෙම සුවිශේෂී ලක්ෂණ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ ශරීරයෙහි දක්නට ලැබුණු බව ථෙරවාදයට අයත් සූත්‍රයන් වන සෙල සූත්‍රය,[35] සුත්ත නිපාත වත්‍ථුගාථා යන ස්ථානවල දක්නට ඇති අතර මහාපදාන,[36] ලක්ඛණ[37] සහ බ්‍රහ්මායු[38] යන සූත්‍රවල සම්පූර්ණ විස්තරයක් දක්නට ලැබෙයි. එහෙත් බෝධිසත්ත්වයන් වහන්සේගේ අවසන් පූර්ව ආත්ම භාවයේ දී ද මෙම සුවිශේෂ ලක්ෂණ දක්නට ලැබුණු බව මහායාන සම්ප්‍රදායට අයත් ලලිතවිස්තරයෙහි සඳහන් වෙයි. විශේෂයෙන් ම බෝධිසත්ත්වයන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුත වන විටත් මව්කුස පිළිසිඳ ගන්නා විටත් බෝසත් සිරුර පරිපූර්ණ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හා අසූ අනුව්‍යංජනයන්ගෙන් සමලංකෘතව පැවති බව එහි සඳහන් වේ.

''බෝසත්හු මවුකුස නැමැති ස්වර්ණ පංජරයෙහි හෙවත් මැණික් මන්දිරයෙහි (රත්න ව්‍යුහ) සුවසේ වාසය කළහ. බෝධිසත්ත්වයන් බුබුළුවලින් සම්මිශ්‍රිත මාංශ පේශීන් සහිත පට්ටයකින් සැදුම් ලද කලල රූපයක් මෙන්

---

ගොප්ඵකං සඞසටෙටනෙතා ගච්ඡති, සො ගච්ඡනෙතා න සත්‍ථිං උනනාමෙති, න සත්‍ථිං ඔනාමෙති, න සත්‍ථිං සනනාමෙති, න සත්‍ථිං විනාමෙති. ගච්ඡතො බො පනසස හොතො ගොතමසස අධරකායොව ඉඤ්ජති. න ච කායබලෙන ගච්ඡති. අවලොකෙනෙතා බො පන සො භවං ගොතමො සබ්බකායෙනෙව අවලොකෙති. සො න උදධං උලෙලොකෙති. න අධො ඔලොකෙති. න ච විපෙක්ඛමානො ගච්ඡති. යුගමත්තඤ්ච පෙක්ඛති. තතො චසස උත්තරිං අනාවටං ඤාණදසසනං භවති.

[30] බ්‍රහ්මායු සූත්‍රය, ම.නි. 2, බුජමු. පිට. 282
සො අනතරඝරං පවිසනෙතා න කායං උනනාමෙති. ....

[31] බ්‍රහ්මායු සූත්‍රය, ම.නි. 2, බුජමු. පිට. 284
සො පතෙතාදකං පතිගණ්හනෙතා න පත්තං උනනාමෙති. ...

[32] බෞද්ධ මහා පුරුෂ සංකල්පය, බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2000, පිට. 41

[33] සොණදණ්ඩ සූත්‍රය, දී.නි. 1. බුජමු. පිට. 228
සමණො බලු ගොතමො අකාමකානං මාතාපිතුනනං අසසුමුඛානං රුදනතානං කෙසමසසුං ඔහාරෙත්වා කාසායානි වත්‍ථානි අච්ඡාදෙත්වා අගාරසමා අනගාරියං පබ්බජිතො...
සමනො බලු ගොතමො අභිරූපො දසසනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමනනාගතො බ්‍රහමවණ්ණී බ්‍රහමවච්චසී අක්ඛුද්දාවකාසො දසසානාය...

[34] පුප්ඵ සූත්‍රය, සං. නි. 3, බුජමු. පිට. 240
සෙය්‍යථාපි භික්ඛවෙ, උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං
උදකා අච්චුගගමම ඨාති. අනුපලිත්තං උදකෙන, එවමෙව බො භික්ඛවෙ, තථාගතො ලොකෙ ජාතො ලොකෙ සංවඩ්ඪො ලොකං අභිභුය්‍ය විහරති අනුපලිත්තො ලොකෙනාති.

[35] සෙල සූත්‍රය, ම. නි. 2. බුජමු. පිට. 598-

[36] මහාපදාන සූත්‍රය, දී. නි. 2. බුජමු. පිටු. 2-

[37] ලක්ඛණ සූත්‍රය, දී. නි. 3, බුජමු. පිටු. 236-

[38] බ්‍රහ්මායු සූත්‍රය, ම. නි. 2. බුජමු. පිටු 576-

මවු කුසින් බිහි වූයේ නො වේ. එහෙත් සම්පූර්ණයෙන් වැඩුණු සියලු ශරීර අවයවයන් සහිත වූයේ (එසේ ම) සියලු මංගල ලක්ෂණයෙන් පරිමිතව මුද්‍රාපිත ආකාරයෙන් දැකිය හැකි විය.''[39]

වසුමිත්‍රයන් විසින් රචනා කරන ලද ග්‍රන්ථයේ දී බුදුරාජාණන් වහන්සේ ආශ්‍රව ධර්මයන්ගෙන් මිදුණු හෙයින් නින්ද නො ලද බවත් සිහින නො දුටු බවත් සඳහන් කරයි. මේ හා සමාන අදහසක් මුල්බුදුසමයේ දී හමු නොවේ. නමුත් උන්වහන්සේගේ සුවිශේෂත්වය මෙසේ විස්තර කෙරේ. ''ලෝකයෙහි මම ම රහත් වෙමි. මම ම නිරුත්තර වූ ශාස්තෘ වෙමි. මම එක ම සම්මාසම්බුද්ධ වෙමි. සියලු කෙලෙස්ගිනි නිවීමෙන් සිසිල් වූයෙමි. එහෙයින් ම නිවුනෙමි වෙමි.'' [40] නින්ද පිළිබඳව හෝ සිහින පිළිබඳව මෙහිදී කිසිවක් සඳහන් නො වුන ද තමන් වහන්සේ සියලු බැඳීම්වලින් මිදුණු බවත් එනිසා තමන් වහන්සේ නිවුණු බවත් පෙන්වා දෙති.

මහායාන සම්ප්‍රදායට අයත් මහාවස්තුව හා ලලිතවිස්තරය වෙත තවදුරටත් අවධාන යොමු කිරීමේ දී පහත සඳහන් සුවිශේෂී කරුණු දක්නට ලැබෙයි. [41]

1. බෝධිසත්වයන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හා අසූඅනුව්‍යංජනයන්ගෙන් සමලංකෘතව ම මවු කුස පිළිසිඳ ගත්හ.
2. මායා දේවිය කුස පිළිසිඳ ගත්තේ මහා පුරුෂ ලක්ෂණ දරන්නකු බව සිහින තේරූ නිමිත්ත පාඨකයෝ ප්‍රකාශ කළහ.
3. මවු කුස සිටිය දී ම හෝ දෙවියනට එම ලකුණු ප්‍රදර්ශනය කළේ ය.
4. ශුද්ධාවාස වැසි දෙවියෝ (මහේශ්වර හු) දෙතිස් ලකුණු පිරික්සූහ.
5. අසිත තවුසා ලකුණු පිරික්සී ය.
6. ගෞතම තපස්වීන් බෝමැඩට සම්ප්‍රාප්ත වූ අවස්ථාවේ කාල හා නාග යන දෙදෙන දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ගැන සඳහන් කරමින් උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය වර්ණනා කළහ.[42]

උක්ත කරුණ යම් පමණකට මුල් බුදුසමය හා සම්බන්ධ වුව ද මෙලෙසින් සම්ප්‍රදාය ගැතිව විවිධ මති මතාන්තර බුදුසමය තුළ ඉදිරිපත් වීම පිළිබඳ ව ථෙරවාදී සම්ප්‍රදාය නො ඉවසූහ. විවධ මතවාද ව්‍යාප්ත වෙමින් පැවති යුගයක දී ඒ මත බිඳහෙළීමේ අරමුණ ඇති ව අවස්ථා දෙකක දී රචනා වූ ග්‍රන්ථ දෙකකි මිළින්දපඤ්හය සහ කථාවත්ථුප්පකරණය. මිළින්දපඤ්හයේ දී බුදුරජාණන් වහන්සේ පිළිබඳව මිළිඳු රජු අසන ප්‍රශ්නවලට නාගසේන හිමි විසින් ලබාදෙන පිළිතුරු ථෙරවාදී අදහස වෙසෙසින් සුපුට කරයි.

''ස්වාමීනි, තථාගතයන් වහන්සේගේ ශරීරයට යම්කිසි දුක්ඛ වේනාවක් ඇතිවේ ද? එසේ ය රජතුමනි, ඇති වෙයි, වරක් රජගහ පුරයේ දී උන්වහන්සේගේ පාදයේ තැල්මක් ඇති වූ කල්හි, පාචන රෝගයෙන් පෙළෙන අවස්ථාවේ දී, විටක වෙදතුමන් විසින් විරේක බෙහෙත් දුන් අවස්ථාවේ දී, රක්ත වාතයෙන් පෙළෙද්දී හා උපස්ථායක තෙරුන් තමන් වහන්සේට අවශ්‍ය උණු දිය සොයා ගිය අවස්ථාවේ දී උන් වහන්සේට දුක් වේදනා ඇති විය.''[43]

[39] ලලිත විස්තරය, පිට 103
[40] අරියපරියේසන සූත්‍රය, ම.නි. 1. බුජමු. පිට. 414
අහං හි අරහා ලොකෙ අහං සත්‍ථා අනුත්තරො,
එකොම්හි සම්මාසම්බුද්ධො සීතිභූතොස්මි නිබ්බුතො.
[41] බෞද්ධ මහා පුරුෂ සංකල්පය, බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2000, පිට. 48
[42] ලලිත විස්තරය, පිට 13-30
[43] මිළින්ද පඤ්හ, 135

බුදුරජාණන් වහන්සේගේ ශාරීරික විශිෂ්ටත්වය හා සර්වඥ භාවයේ විශාරදත්වය ප්‍රකට කිරීමට ථෙරවාදී සම්ප්‍රදාය ද තරමක උත්සහයක් ගෙන ඇත. ඒ සඳහා දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ පමණක් ප්‍රමාණවත් නො වූ හෙයින් අසීති අනුව්‍යංජන නමින් තවත් ශාරීරික ලක්‍ෂණ සංග්‍රහයක් ආරෝපණය කරන ලදි. [44]

කෙසේ වුව ද බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව පමණ ඉක්මවා කරන පැහැදිලි කිරීම් ප්‍රතික්‍ෂේප කිරීම ථෙරවාද සම්ප්‍රදාය බව කථාවත්ථුප්පකරණයෙන් පැහැදිලි වේ. ''බුදුරජාණන් වහන්සේ මේ භෞතික ලෝකයෙහි වැඩ නො සිටිය හ.[45] බුදුරජාණන් වහන්සේ සියලු දිසා හි වැඩ සිටි සේක.''[46] යනුවෙන් මහා සංඝිකයන් කරන ලද ප්‍රකාශ තමන්ගේ ප්‍රකාශ නො වන බව ප්‍රකාශ කිරීමට ථෙරවාදීහු නො පැකිලි වූ අතර එම අදහස් ප්‍රතික්‍ෂේප කිරීමට ද සමත් විය.

''බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයා ඉදිරියේ රඟපෑමක් කළහ. උන්වහන්සේ වැඩමවීම (ඇවිදීම), වැඩහිදීම, සැතපීම ආදී ඉරියව් දැරීම සිදු කළ ද උන්වහන්සේට කිසි විට විඩාවක් නො වීය. උන්වහන්සේ තම දෙපා අපිරිසිදු නොවුන ද දෙවීම (සේදීම) සිදු කළහ. උන්වහන්සේගේ ශ්‍රී මුඛය නෙලුම් පියුමක් බඳු සුවඳ විහිදුව ද සේදූ හ. උන්වහන්සේට කුසගිනි නොවුනද දන් වැළඳූහ. උන්වහන්සේ කිසි විට රෝගී නොවුන ද ප්‍රතිකාර ලබා ගත්හ. මේ සියල්ල උන්වහන්සේ විසින් පූර්ව ජන්මයන්හි දී සිදු කරන ලද පුණ්‍යශක්තීන්ගේ විපාකයෝ ය.''[47] යනුවෙන් මහාවස්තුවෙහි සඳහන් කරුණු ද බුදුරජාණන් වහන්සේගේ ලක්‍ෂණ ලෙස ථෙරවාදීහු නො පිළිගනිති.

කෙසේ වුව ද කාලානුවර්ථනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ද මිනිසාගේ අදහස් හා අවශ්‍යතා මත වෙනස්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ද වර්තමානය වන විට ථෙරවාදී හා මහායාන වශයෙන් පහසුවෙන් වෙන් කොට හඳුනාගත හැකි ලක්‍ෂණ දක්නට ඇත්තේ ස්වල්ප වශයෙනි.

පූජ්‍ය ඉලුක්වෙල ධම්මරතන හිමි,
B.A. (BPU), M.A. (Kelaniya),
කථිකාචාර්ය (ආධුනික),
බෞද්ධ දර්ශනය අධ්‍යනාංශය,
බෞද්ධ අධ්‍යයන පීඨය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

---

[44] බෞද්ධ මහා පුරුෂ සංකල්පය, බෙල්ලන්විල විමලරතන හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2000, පිට. 50
[45] Kathāvatthu, xviii, p. 1
න වත්තබ්බං බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසී ති.
[46] Kathāvatthu, xxi, p. 6
සබ්බා දිසා බුද්ධා තිට්ඨන්තී ති.
[47] Mahāvastu, i, p. 169, L ankāâtāra Sutta p. 28, 34